**2025 වර්ෂය සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල රැස්වීම 2024.08.23**
**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

ඒකාබද්ධ රියදුරු සේවයේ නිලධාරීන්ගේ අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල රැස්වීම 2024.08.23 දින පෙ.ව.9.30ට භාණ්ඩාගාර පැරණි ගොඩනැගිල්ලේ කාමර අංක 326 හිදී අතිරේක ලේකම් ඩී.එච්.එස්. පුල්ලපෙරුම මියගේ ප්‍රධානත්වයෙන් යුතුව පහත නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

**ස්ථාන මාරු මණ්ඩලය :**

**නිර්මලී කුමාරගේ මිය** - සභාපති
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

**කේ.සත්‍යකුමාර් මයා** - සාමාජික
අධ්‍යක්ෂ

**එච්.ඒ.වී.කේ. පලන්සූරිය මෙය** - සාමාජික
සහකාර ලේකම්

**වෘත්තීය සමිති නියෝජිතයින් :**

| | | |
|---|---|---|
| I. | කේ.ටී.එන්.සිසිර කුමාර පෙරේරා මහතා | - සමස්ත ලංකා රියදුරු සංගමය |
| II. | ශාන්ත වීරබද්ධන මහතා | - ලංකා රජයේ රියදුරු සංගමය |
| III. | ඩබ්. හසන් ප්‍රනාන්දු මහතා | - සමස්ත ලංකා රියදුරු සංගමය |
| IV. | ඒ.එම්.එල්. දීපාල් මහතා | - පොදු සේවක සංගමය |

02. 2025 වසරේ රේගු දෙපාර්තමේන්තුවේ විශ්‍රාම යෑමට නියමිත ඒකාබද්ධ රියදුරු සේවයේ නිලධාරීන් හා වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කරන රියදුරු සේවයේ නිලධාරීන්ගේ පුරප්පාඩු 28ක් පවතින බව රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක CUS/HRM/DR1/5/2024 හා 2024.06.18 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත. ඒ අනුව, අමාත්‍යාංශය තුල සේවා කාලය සැලකිල්ලට ගෙන ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ අනුපිළිවෙලට ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවට ස්ථාන මාරුවීමට ඉදිරිපත් කර තිබූ ඉල්ලීම් අනුව එම දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරුවීම් ලබාදෙන ලදී.

03. ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ වයස අවුරුදු 55ට වැඩි රියදුරු මහතුන් කිහිපදෙනෙකු ඔවුන් විශ්‍රාම යාමට ආසන්න බැවින් රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථානමාරු ලබා දීමේදී එම නිලධාරීන්හට ප්‍රමුඛතාවය ලබා දෙන ලෙස 2024.07.22 දිනැතිව ඉල්ලීමක් ඉදිරිපත් කර තිබූ අතර, එම ඉල්ලීම සම්බන්ධයෙන් ස්ථාන මාරු මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කරන ලදී. නමුත් වයස අවු. 55ට වැඩි නිලධාරීන්ගෙන් 10:2 අනුපාතය පදනම් කරගෙන රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථානමාරු ලබා දීම දැනටමත් සිදුකරන බැවින් මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කළ නොහැකි බව වෘත්තීය සමිති නියෝජිතයන් විසින් දැනුම් දෙන ලදී.

05. ඒ අනුව, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවෙහි පවතින ඒකාබද්ධ රියදුරු සේවයේ පුරප්පාඩු 28 සඳහා වයස අවු. 55ට වැඩි අයගෙන් 10:2 අනුපාතය පදනම් කරගෙන නිලධාරීන් 04දෙනෙකු නම්කරන ලද අතර, උපලේඛනයේ සඳහන් අනුපිළිවෙල අනුව අනෙකුත් පුරප්පාඩු 24 සඳහා ද ඇමුණුම **01** පරිදි ස්ථාන මාරුවීම් ලබාදෙන ලදී.

06. ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ 131 ස්ථානයේ නම සඳහන් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ සේවය කරන රියදුරු ජී.ඒ.සිසිර මහතා දැනට වයස අවුරුදු 57 පසුවන බැවින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ස්ථානමාරු ඉල්ලුම් කර ඇත. 2025 වසරේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වසර 05ක සේවා කාලයක්

සම්පූර්ණ කරන රියදුරු මහතුන් සහ පෙර වසරවල වාර්ෂික ස්ථානමාරු නියෝග ලබා අනුප්‍රාප්තික නිලධාරීන් නොපැමිණීම හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් නිදහස් නොකළ නිලධාරීන් ඇතුලුව රියදුරු සේවයේ පුරප්පාඩු 12ක් සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ අංක IRD/HRA/07/Annual Transfer/Gen/2025 හා 2024.07.22 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත.

07. ඒ අනුව, අනුප්‍රාප්තික නිලධාරියෙකු අවශ්‍ය බැවින් රියදුරු ජී.ඒ.සිසිර මහතාහට 2025 වාර්ෂික ස්ථානමාරු යටතේ ප්‍රමුඛතාවය ලබා දෙන ලෙසට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දෙන ලදී.

| | | |
|---|---|---|
| නිර්මලී කුමාරගේ මිය | කේ.සත්‍යකුමාර් මයා | එච්.ඒ.වී.කේ. පලන්සූරිය මෙය |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | අධ්‍යක්ෂ | සහකාර ලේකම් |
| සභාපති | සාමාජික | සාමාජික |

නිර්මලී ප්‍රියංගනී කුමාරගේ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
කොළඹ 01

එච්. ඒ. වී. කේ. පලන්සූරිය
සහකාර ලේකම්
මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
කොළඹ 01